සැ. යු.-2024.05.10 දින පළවූ අංක 2384 ගැසට් පත්‍රයේ (II) සහ (IVඅ) කොටස් පළ නොවීය.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,385 - 2024 මැයි මස 17 වැනි සිකුරාදා - 2024.05.17**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 1454 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1466 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2024 ජූනි මස 07 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 මැයි මස 22 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov*.කන වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


1451- B 82570 — 5,403 (2024/05)
B-1

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

“1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත”

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිඳු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

### රජයේ කර්මාන්ත ශාලා දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය සේවා (PL 3) ශ්‍රේණියේ විවෘත බඳවා ගැනීම් සඳහා ඉල්ලුම්පත් කැඳවීම - 2024

1.0 රජයේ කර්මාන්ත ශාලා දෙපාර්තමේන්තුවේ පහත සඳහන් ප්‍රාථමික ශිල්පීය සේවා ශ්‍රේණියේ තනතුරුවල පවත්නා පුරප්පාඩු පිරවීම සඳහා රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

2.0 රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය සේවා ශ්‍රේණියේ තනතුරුවල පවත්නා පුරප්පාඩු පහත වගුවෙන් දැක්වේ.

| *අනු අංකය* | *අනුමත තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* |
|---|---|---|
| 01. | වාත්තුකරු (Moulder) | 03 |
| 02. | පෑස්සුම්කරු (Welder) | 03 |
| 03. | කෝර්කරු (Core maker) | 02 |
| 04. | උඳුන්කරු (Furnaceman) | 01 |
| 05. | බර වාහන ක්‍රියාකරු (Heavy Vehicle Operator-Driver) | 01 |
| 06. | නළ කර්මාන්තකරු (Plumber) | 02 |
| 07. | යන්ත්‍ර ක්‍රියාකරු (නිෂ්පාදන) (Plant & Machinery Operator) | 01 |
| 08. | වාත්තුමල්කරු (Foundry Pattern Maker) | 01 |
| | එකතුව | 14 |

3.0 වැටුප් පරිමාණය :-

3.1 වැටුප් කේත අංකය - PL 3-2016

3.2 වැටුප් පරිමාණය - රු. 25,790 - 10 x 270 - 10 x 300 - 10 x 330 - 12 x 350 - රු. 38,990

3.3 ආරම්භක වැටුප් පියවර :

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු.) |
|---|---|---|
| III | පියවර 01 | රු. 25,790 |
| II | පියවර 12 | රු. 28,790 |
| I | පියවර 22 | රු.31,820 |
| විශේෂ | පියවර 32 | රු. 35,140 |

- රජයේ කර්මාන්ත ශාලාවේ ඇති C, CE සහ J පන්ති වල වාහන ක්‍රියාකරවීම සඳහා නියමිත බලපත්‍ර සහිතව එම පන්ති වලට අයත් වාහන ක්‍රියාකරවීමට බඳවා ගනු ලබන බර වාහන යන්ත්‍ර ක්‍රියාකරුවන් පමණක් එම වැටුප් පරිමාණයේ 4 වන වැටුප් තලයේ පිහිටුවීමටත් කටයුතු කරනු ලැබේ.

4.0 *තනතුරෙහි/තනතුරුවල ස්වභාවය* :-ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය.
(විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට යටත් විය යුතුවේ.)

5.0 බඳවා ගැනීමේ ශ්‍රේණිය :- III ශ්‍රේණිය

6.0 භාෂා මාධ්‍යය :- සිංහල හා දෙමළ මාධ්‍යය

7.0 පැවරෙන කාර්යය භාරය :-

| අනුමත තනතුරු නාම | කාර්යයන් |
|---|---|
| වාත්තුකරු | වාත්තු ගැනීමට අවශ්‍ය වන වාත්තු අච්චු සෑදීම සඳහා ඒවා සූදානම් කිරීම හා වාත්තු ගැනීමේ කටයුතු කිරීම හා ඒ සඳහා වන ඇස්තමේන්තු විස්තර ලබාදීම. |
| පෑස්සුම්කරු | ගෑස්, විද්‍යුත්, ටිග් (TIG ) සහ මිග් (MIG ) වෙල්ඩින් යන්ත්‍ර භාවිතා කරමින් සියලුම පෑස්සුම් කටයුතු (පිත්තල, ඇලුමිනියම්, යකඩ, චීනච්චට්ටි හා සුදු යකඩ පෑස්සුම් ඉටු කිරීම) මෙම කාර්යයන් සඳහා වන ඇස්තමේන්තු විස්තර ලබා දීම. |
| කෝරකරු | වාත්තු කිරීම්වල දී අවශ්‍ය වන සියලුම ආකාරයේ කෝර (Core) සෑදීම, එම කෝර සෑදීම සඳහා වන ඇස්තමේන්තු විස්තර ලබා දීම |
| උඳුන්කරු | සියලු වාත්තු ගැනීමේ දී අවශ්‍ය වන උදුන් ( Cupola, Rotary furnace, ladle furnace) ක්‍රියාත්මක කරවීම හා උදුන් අලුත්වැඩියා කටයුතු කිරීම හා ඒ සඳහා වන ඇස්තමේන්තු විස්තර ලබා දීම |
| බර වාහන ක්‍රියාකරු | බර වාහන පැදගෙන යාම, Crane ආදී උපකරණ (Prime Mover යන්ත්‍ර, Boom Truck, Forklift, Bobcat යන්ත්‍ර) ක්‍රියාත්මක කරවීම හා එම වාහනවල සුළු සේවා කටයුතු කිරීම |
| නළ කර්මාන්තකරු | වායු සම්පීඩන යන්ත්‍ර, බොයිලේරු ක්‍රියාත්මක කිරීමේ දී හා සුළු නඩත්තු කටයුතු කිරීම හා ඒ සඳහා වන ඇස්තමේන්තු විස්තර ලබා දීම. |
| යන්ත්‍ර ක්‍රියාකරු (නිෂ්පාදන) | ඇණ සාදන යන්ත්‍රය හා වෙනත් නිෂ්පාදන ක්‍රියාවලි සඳහා වන යන්ත්‍ර ක්‍රියාකරවීම, ඒවායේ සුළු නඩත්තු කටයුතු කිරීම හා එම ක්‍රියාවන් සඳහා ඇස්තමේන්තු විස්තර ලබා දීම. |
| වාත්තුමල්කරු | වාත්තු අච්චු සෑදීම සඳහා අවශ්‍ය වන වාත්තුමල් ලීවලින් සෑදීම හා ඒ සඳහා වන ඇස්තමේන්තු විස්තර ලබා දීම. |

8.0 මෙම පත්වීම තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්ය. පත්කිරීම් බලධරයා විසින් තීරණය කරනු ලබන යම් සුවිශේෂී හේතුන් මත එම කාලය දීර්ඝ කිරීමට හෝ පත්වීම අවසන් කිරීමට පත්වීම් බලධරයා හට බලය ඇත.

9.0 සුදුසුකම් :-

I. *අධ්‍යාපන සුදුසුකම් :*
අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් 06ක් සමත් වී තිබීම.

**සටහන :** ❖ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 28/2016ට අනුව ක්ෂේත්‍රයට අදාළව NVQ 03 හෝ NVQ 04 වන මට්ටමේ නිපුණතාවයක් ලබා ඇත්නම් අංක I යටතේ සඳහන් කර ඇති අධ්‍යාපන සුදුසුකම් අදාළ නොවේ.

*සහ*

II. *වෘත්තීය සුදුසුකම් :* එක් එක් තනතුරෙහි කාර්යය භාරයට අදාළව තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන් හි (NVQ 04) හතර මට්ටමට නොඅඩු නිපුණතාවක් ලබා තිබීම.

**රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය සේවා ගණය සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම සඳහා වෘත්තීය සුදුසුකම් :**

| *අනු අංකය* | *අනුමත තනතුරු නාමය* | *වෘත්තීය සුදුසුකම්* |
|---|---|---|
| 01. | වාත්තුකරු | I. පිළිගත් කාර්මික ආයතනයකින් අවම වශයෙන් වසර දෙකක පාඨමාලාවක් හදාරා ලබාගත් සහතිකය සහ පහත සඳහන් වෘත්තීය නිපුණතා හා පළපුරුද්ද පිළිබඳව සහතික ඉදිරිපත් කළ යුතුය.<br>II. ෆෙරස් සහ නිෆෙරස් වාත්තු සඳහා අමු පස්, වියළි සහ ලෝම් සහිත මිශ්‍රණයේ සංයුතිය තීරණය කර අදාළ අමුද්‍රව්‍යවලට උචිත වන අයුරු අදාළ වාත්තු ලබාගැනීමට අච්චු මට්ටම් කටු යොදාකළ හැකි විය යුතුයි.<br>III. ෆෙරස් සහ නිෆෙරස් මාධ්‍ය වල විවිධ කෝර වාත්තු අච්චු සාර්ථකව සෑදීමට හැකිවිය යුතුයි.<br>IV. ලෝම් පස්වලින් හැඩමල් වාත්තු අච්චු සෑදීම සඳහා දැනුමක් තිබිය යුතුයි.<br>V. දැනට ඇති අමුද්‍රව්‍ය යොදා ගෙන විශේෂ වැඩ සඳහා සහ සාමාන්‍යයෙන් භාවිතයට ගන්නා මොල්ඩින් පෙට්ටි රාමු, ඔසවනයන් සහ සිට්බලයන් පිරිසකස් කර වැඩිදියුණු කර ආර්ථික ඵලදායී ලෙස යොදාගත හැකි විය යුතුයි.<br>VI. උණු කරන ලද ලෝහය සාමාන්‍යයෙන් පරීක්ෂා කර බලා එම ලෝහය වාත්තු අච්චුවලට වක්කිරීමට සුදුසු අවස්ථාව තීරණය කර ආධාරකරුවන් සහ හැඩලය ක්‍රියාකරවන්නන් මෙහෙයවා වාත්තු ලබාගැනීමට හැකි විය යුතුයි.<br>VII. ෆෙරස් සහ නිෆෙරස් වාත්තුවලදී යොදා ගන්නා විලින් තාක්ෂණය පිළිබඳ හොඳ දැනුමක් තිබිය යුතුයි.<br>VIII. කෝර සෑදීම පිළිබඳ හොඳ දැනුමක් තිබිය යුතුයි. |
| 02 | පැස්සුම්කරු | NVQ 4 වන මට්ටමේ ප්‍රවීණතාවය ලබා තිබීම. |
| 03 | කෝරකරු | I. පිළිගත් කාර්මික ආයතනයකින් අවම වශයෙන් වසර එකක පාඨමාලාවක් හදාරා ඉන් සමත් වී ලබාගත් සහතිකය සහ පහත සඳහන් වෘත්තීය නිපුණතා හා පළපුරුද්ද පිළිබඳ සහතික ඉදිරිපත් කළ යුතුය.<br>II. විශේෂ වැඩ සඳහා සුදුසු කෝර සැකිලි පැස්සීම හෝ වාත්තු කිරීම පිළිබඳ සැලසුම් කිරීමේ හැකියාව තිබිය යුතුය.<br>III. විවිධ ප්‍රමාණයේ වැලි කෝර සහ හැඩ සඳහා වෙන්ටින් සහ බේකින් ක්‍රම පිළිබඳ දැනුම තිබිය යුතුයි.<br>IV. කෝර පස් වැලි මිශ්‍රණයක් සාදාගෙන රැම් කර රේන්පෝස්කර වෙන්ට් ඩිලිවරි සහ ඩ්‍රෙස් කෝර සකස් කර කෝර පෙට්ටියක් සෑදීම.<br>V. ඔයිල් සැන්ඩ් මිශ්‍රණය සෑදීම සහ එමඟින් කෝර සෑදීමට හැකි විය යුතුයි.<br>VI. ෆෙරස් වැඩ සඳහා වියළි නිෆෙරස් විශේෂිත / ග්‍රීන්ඩ් සහ ලෝම් වර්ගයේ කෝර සෑදීමට අවශ්‍ය පස් මිශ්‍රණයක් නියමිත අනුපාතයට සකස් කර ගත හැකි විය යුතුයි.<br>VII. ලොම් සැන්ඩ් මඟින් පයිප්ප කෝර සෑදීම සහ එම මාධ්‍යයේම ආධාරක කෝර පෙට්ටි මත හෝ ටෙම්ප්ලේට් ආධාරක යොදාගෙන කෝර සැකිලි සෑදීම කළ හැකි විය යුතුයි.<br>VIII. මෝල්ඩ් සෑදීම පිළිබඳ දැනුමක් සහ නිපුණතාවයෙන් උසස් මෝල්ඩකරුවෙකු වීම. |

| අනු අංකය | අනුමත තනතුරු නාමය | වෘත්තීය සුදුසුකම් |
|---|---|---|
| 04 | උඳුන්කරු | I. පිළිගත් කාර්මික ආයතනයකින් අවම වශයෙන් වසර එකක පාඨමාලාවක් හදාරා ඉන් සමත් වී ලබාගත් සහතිකය සහ පහත සඳහන් වෘත්තීය නිපුණතා හා පළපුරුද්ද පිළිබඳ සහතික ඉදිරිපත් කළ යුතුය.<br>II. ෆෙරස් සහ නිෆෙරස් අංශවල ඇති විවිධ ලෝහ (ඇලෝයිස්) කොටස් කැඩීමෙන් හෝ අනිකුත් ක්‍රම මඟින් හඳුනා ගත හැකි විය යුතුයි.<br>III. නන්ෆෙරස් ෆර්නස්, ක්‍රැසිබල්ස්, ක්‍රැසිබල් නොවන, ඔයිල් ෆයර්ඩ් ෆර්නස් සහ කියුපෝලා ක්‍රියා කරවීමට සහ අලුත්වැඩියා නඩත්තු කටයුතු කළ හැකි විය යුතුය.<br>IV. කියුපෝලාවට සහ ෆර්නසයට සම්බන්ධවන බ්ලෝවර්ස්, බර්නර්ස්, ඔසවන සහ අමුද්‍රව්‍ය ඇතුළත් කරන උපකරණ සහ බර කිරන සියලුම යන්ත්‍ර ක්‍රියා කරවිය හැකි විය යුතුයි.<br>V. ද්‍රාවණය කරන ලද ලෝහයේ උෂ්ණත්වය මැනීම සඳහා ෆයිරෝ මීටරයක් භාවිතා කිරීමට මූලික දැනීමක් තිබිය යුතුයි.<br>VI. ෆෙරස් / නිෆෙරස් උණුකිරීම්වලදී යොදා ගන්නා කියුෆෝලා උඳුන්වලින් ටැප් කර ලබා ගන්නා ලෝහ ද්‍රාවණය හෝ ඉන්ධන සහ වාතයේ මිශ්‍රණ අනුපාතවලට අනුව පිටවන දුම පරීක්ෂා කිරීමෙන් ද්‍රාවණය වෙමින් ඇති ලෝහයේ තාපය පිළිබඳ හොඳ දැනුමක් තිබිය යුතුයි.<br>VII. උණුකිරීම්වලට යොදා ගන්නා ඉන්ධන සහ ලෝහ අතර අනුපාත ගැන දැන ගත යුතුවන අතර වඩා ආර්ථික වශයෙන් ඵලදායී මට්ටම් මොනවාද යන්න දැන සිටිය යුතුයි. |
| 05 | බර වාහන ක්‍රියාකරු | I. බර වාහන ක්‍රියා කරවීම සම්බන්ධයෙන් අවම වශයෙන් වසර (10) දහයක පිළිගත් ලියාපදිංචි ආයතනයක පළපුරුද්දක් ලබා තිබිය යුතුයි.<br>II. බර වාහනවල නඩත්තුව පිළිබඳ මූලික අවබෝධයක් ලබා තිබිය යුතුයි.<br>III. ප්‍රයිම් මූවර් ට්‍රේලර් ක්‍රියාකරවිය හැකි විය යුතුයි.<br>IV. ක්‍රේන් යන්ත්‍රයක් ක්‍රියාකරවිය හැකි විය යුතුයි.<br>V. ලොරි සහ පෝක්ලිෆ්ට් ක්‍රියාකරවිය හැකි විය යුතුයි.<br>VI. NVQ හතරවන මට්ටමේ ප්‍රවීණතාවය ලබා තිබීම.<br>VII. රියදුරු බලපත්‍රයේ **C, CI** හා **I** කාණ්ඩවලින් සමන්විත විය යුතුයි. |
| 06 | නළ කර්මාන්තකරු | I. පිළිගත් කාර්මික ආයතනයකින් අවම වශයෙන් වසර දෙකක පාඨමාලාවක් හදාරා තිබීම සහ පහත සඳහන් වෘත්තීය සුදුසුකම් ලබා ඇති බවට සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.<br>II. වෘත්තියට අදාළ සැලසුම් කියවා තේරුම් ගත හැකි විය යුතුය.<br>III. උණුසුම් සහ සීතල ජලසැපයුම් නළ සවිකිරීම සහ නඩත්තුව.<br>IV. මළ අපද්‍රව්‍ය පද්ධති සවි කිරීම හා නඩත්තුව.<br>V. චිල් ජල නල සවි කිරීම සහ නඩත්තුව.<br>VI. වාෂ්ප පයිප්ප පද්ධති සවි කිරීම සහ නඩත්තුව.<br>VII. සම්පීඩන වායු නළ පද්ධති සවි කිරීම සහ නඩත්තුව.<br>VIII. ගිනි නිවන උපකරණ සහ උපාංග සවි කිරීම සහ නඩත්තු කිරීම.<br>IX. පොම්ප සවි කිරීම හා නඩත්තුව. |
| 07 | යන්ත්‍ර ක්‍රියාකරු (නිෂ්පාදන) | I. පිළිගත් කාර්මික ආයතනයකින් අවම වශයෙන් වසර දෙකක පාඨමාලාවක් හදාරා ලබාගත් සහතිකය සහ පහත සඳහන් වෘත්තීය නිපුණතා හා පළපුරුද්ද පිළිබඳව සහතික ඉදිරිපත් කළ යුතුය.<br>II. වෘත්තියට අදාළ සැලසුම් කියවා තේරුම් ගත හැකි විය යුතුය.<br>III. බෝල්ට් හැඩ තලන යන්ත්‍රය ක්‍රියාකරවිය යුතුයි.<br>IV. ද්‍රව පීඩක යන්ත්‍ර ක්‍රියාකරවීම.<br>V. කම්මල් හැඩ තලන යන්ත්‍ර සහ පීඩක ක්‍රියාකරවීම.<br>VI. යන්ත්‍රයේ වේගය පාලනය කිරීම සඳහා සීරුමාරු කිරීම.<br>VII. නිෂ්පාදන යන්ත්‍ර ක්‍රියාකරවීම සහ නඩත්තුව.<br>VIII. නිෂ්පාදනවල පිරිවිතර පරීක්ෂා කිරීම නිෂ්පාදන වාර්තා සැකසීම.<br>IX. අදාළ යන්ත්‍රවල සුළු අළුත්වැඩියාවන් සිදු කිරීම. |

| *අනු අංකය* | *අනුමත තනතුරු නාමය* | *වෘත්තීය සුදුසුකම්* |
|---|---|---|
| 08 | වාත්තුමල්කරු | I. පිළිගත් කාර්මික ආයතනයකින් අවම වශයෙන් එක් අවුරුදු පාඨමාලාවක් හදාරා ලබාගත් සහතිකය සහ පහත සඳහන් වෘත්තීය නිපුණතා හා පළපුරුද්ද පිළිබඳව සහතික ඉදිරිපත් කළ යුතුයි.<br>II. වෘත්තියට අදාළ සැලසුම් කියවා තේරුම් ගත හැකි විය යුතුය.<br>III. විවිධ ලෝහ සඳහා කන්ට්‍රැක්ෂන් රූල් භාවිතා කිරීමට දැන සිටිය යුතුයි.<br>IV. විවිධ ලෝහ වර්ග ගැන සහ වාත්තු ලබා ගැනීම පිළිබඳ හොඳ දැනුමක් තිබිය යුතුයි.<br>V. කෝර ප්‍රින්ට් භාවිතා කිරීමට අදාළ දෙන ලද සැලසුමකට අනුව වාත්තු මලක් සෑදීමට හැකිවිය යුතුයි.<br>VI. සියළුම වර්ගවල වාත්තුමල් සෑදීම සහ මෙම වෘත්තියේ යොදාගනු ලබන විවිධ කන්ට්‍රැක්ෂන් පරිමාණ භාවිතාව පිළිබඳ හොඳ අවබෝධයක් තිබිය යුතුයි. |

III). පළපුරුද්ද : රජයේ හෝ පෞද්ගලික ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර දෙකක (02) පළපුරුද්ද අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

IV). කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

V). වෙනත් :

I). ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
II). අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
III). තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

9.0 වයස :
10.1 අවම සීමාව : අවු. 18 ට නොඅඩු
10.2 උපරිම සීමාව : අවු. 45 ට නොවැඩි
(අයදුම්පත් කැඳවන අවසන් දිනට)

10.0 බඳවා ගැනීමේ ක්‍රමය : වෘත්තීය ප්‍රායෝගික පරීක්ෂණයෙන් සමත් වන සහ යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගන්නා මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගනු ලැබේ.

10.1 *වෘත්තීය ප්‍රායෝගික පරීක්ෂණය* - ප්‍රායෝගික පරීක්ෂණයකි.

| *විෂයය* | *විෂය නිර්දේශය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|---|
| විෂයය දැනුම | **1. වාත්තුකරු**<br>ප්‍රායෝගික පරීක්ෂණය පහත සඳහන් විෂයය ක්ෂේත්‍ර දෙකකින් සමත් විය යුතුයි.<br>a) අමු පස් හෝ වියළි අරු පස් යොදාගෙන සංකීර්ණ කොටස් තුනක හෝ දෙකක මධ්‍යම ප්‍රමාණයේ වාත්තු අච්චුවක් ෆෙරස් හෝ නිෆෙරස් වාත්තුවක් සඳහා පිළියෙළ කළ යුතුයි. සාදන ලද අච්චුව වාත්තු පරීක්ෂණයකට සතුටුදායක ලෙස භාජනය කළ හැකි විය යුතුයි. | පැය 01 | 100 | 40 |

| *විෂයය* | *විෂය නිර්දේශය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|---|
| විෂයය දැනුම | b) කොටස් දෙකක හෝ තුනක වාත්තු අච්චුවක් සෑදීම සඳහා වියළි අරු පස් හෝ අමු පස් සකසා ගෙන සංකීර්ණ හෝ මධ්‍යම ප්‍රමාණයේ වාත්තු අච්චුවක් ෆෙරස් හෝ නිෆෙරස් ලෝහවලින් සෑදීම. මෙම වාත්තු අච්චුව සතුටුදායක ලෙස වාත්තු පරීක්ෂණයකට භාජනය කළ හැකි විය යුතුය.<br><br>**2. පෑස්සුම්කරු :**<br><br>ප්‍රායෝගික පරීක්ෂණය පහත සඳහන් විෂය ක්ෂේත්‍ර හතරකින් සමත් විය යුතුයි.<br><br>NVQ *හතරවන මට්ටම ආර්ක් පෑස්සුම* :<br><br>a) ඔක්සි ඇසිටිලීන් ගෑස් මගින් වානේ කැපීම<br>b) ප්ලැට් පිහිටීමේ දී වානේ තහඩු මැනුවල් ආර්ක් ක්‍රමයට පෑස්සීම (1G සහ 1F)<br>c) තිරස් පිහිටීමේ දී වානේ තහඩු මැනුවල් ආර්ක් ක්‍රමයට පෑස්සීම<br>d) සිරස් පිහිටීමේ දී වානේ තහඩු මැනුවල් ආර්ක් ක්‍රමයට පෑස්සීම (3G)<br>e) ඕවර්හෙඩ් ක්‍රමයට වානේ තහඩු මැනුවල් ආර්ක් ක්‍රමයට පෑස්සීම (4G)<br>f) සෝල්ඩරින් සහ බ්‍රෙසීන් කිරීම<br><br>NVQ *හතරවන මට්ටම ටිග් පෑස්සුම*<br><br>a) ඔක්සි ඇසිටිලීන් ගෑස් මගින් වානේ කැපීම<br>b) ප්ලැට් පිහිටීමේ දී වානේ තහඩු ඔක්සි ඇසිටිලීන් ගෑස් ක්‍රමයට පෑස්සීම<br>c) තිරස් පිහිටීමේ දී වානේ තහඩු ඔක්සි ඇසිටිලීන් ගෑස් ක්‍රමයට පෑස්සීම<br>d) සිරස් පිහිටීමේ දී වානේ තහඩු ඔක්සි ඇසිටිලීන් ගෑස් ක්‍රමයට පෑස්සීම (3G)<br>e) ඕවර්හෙඩ් ක්‍රමයට වානේ තහඩු ඔක්සි ඇසිටිලීන් ගෑස් ක්‍රමයට පෑස්සීම (4G)<br>f) සියලුම පිහිටීමේ දී වානේ පයිප්ප ඔක්සි ඇසිටිලීන් ගෑස් ක්‍රමයට පෑස්සීම (6G)<br><br>**3. කෝරකරු**<br><br>ප්‍රායෝගික පරීක්ෂණය පහත සඳහන් විෂය ක්ෂේත්‍ර දෙකකින් සමත් විය යුතුයි :<br>a) කෝර පස් වැලි මිශ්‍රණයක් සාදාගෙන රැම් කර රේන්පෝස්කර වෙන්ට් ඩිලිවරි සහ ඩ්‍රෙස් කෝර සකස් කර කෝර පෙට්ටියක් සෑදීම.<br>b) ෆෙරස්/නිෆෙරස් වැඩ සඳහා අවශ්‍ය කෝර වැලි ගම් සහ ඩ්‍රෙසින් මිශ්‍රණයේ සංයුතිය නිවැරදිව යොදා ගෙන කෝරවැලි මිශ්‍රණය සාදා ගැනීම.<br>c) විශේෂිත වැඩ, සංකීර්ණ සහ කෝර කිහිපයක් ඇති වැඩ පැකින් බ්ලොක් සඳහා කෝර සෙට් කිරීමේ දී අවශ්‍ය (පැකින් බ්ලොක්) ටෙම්ප්ලේට් සහ ගේජස් යොදා සැකසීම.<br>d) ඔයිල් සෑන්ඩ් මිශ්‍රණය සෑදීම සහ එමගින් කෝර සෑදීමට හැකි විය යුතුයි.<br><br>**4. උඳුන්කරු :**<br><br>ප්‍රායෝගික පරීක්ෂණය පහත සඳහන් විෂය ක්ෂේත්‍ර දෙකකින් සමත් විය යුතුයි.<br>a) දෙන ලද පිරිවිතරයකට අනුව උඳුන/කියුපෝලාව ක්‍රියා කරවීම සඳහා අවශ්‍ය ලෝහ ද්‍රව්‍යවල නියමිත බර හඳුනාගෙන කිරා උඳුන/කියුපෝලාව නිසි පරිදි ක්‍රියා කරවීම<br>b) ෆෙරස්/නිෆෙරස් අංශවල යොදා ගන්නා පොදු ලෝහ වර්ග හඳුනා ගත හැකි විය යුතු වන අතර කියුපෝලාවට යොදා ගත යුතු නිවැරදි කෝක් ග්‍රේඩය හඳුනා ගත හැකි විය යුතුයි. | පැය 01 | 100 | 40 |

| විෂයය | විෂය නිර්දේශය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| | c) ෆර්නසය ක්‍රියා කරවීම ආරම්භ කර අවශ්‍ය ලෝහ කොටස් චාර්ජ් කර උණුකර අප ද්‍රව්‍ය ඉවත් කර ද්‍රවණය වූ ලෝහය ලබා ගෙන ෆර්නසය තමා විසින්ම නවතා දැමීමට හැකි විය යුතු වන අතර උදව්කරුවන් යොදා ගෙන සාර්ථකව වාත්තුව ලබා ගත හැකි විය යුතුයි.<br>d) කියුපෝලාවට සහ ෆර්නසයට සම්බන්ධවන බ්ලෝවර්ස්, බර්නර්ස්, ඔසවන සහ අමුද්‍රව්‍ය ඇතුළත් කරන උපකරණ, සහ බර කිරන සියලුම යන්ත්‍ර ක්‍රියා කරවිය හැකි විය යුතුයි.<br>e) ෆෙරස් සහ නිෆෙරස් අංශ වල ඇති විවිධ ලෝහ (ඇලෝයිස්) කොටස් කැඩීමෙන් හෝ අනිකුත් ක්‍රම මගින් හඳුනා ගත හැකි විය යුතුයි.<br><br>**5. බර වාහන ක්‍රියාකරු :**<br><br>ප්‍රායෝගික පරීක්ෂණය පහත සඳහන් විෂය ක්ෂේත්‍ර දෙකකින් සමත් විය යුතුයි.<br>a) මගී බස්රථයක් පැදවිය හැකි විය යුතුයි.<br>b) භාණ්ඩ රැගෙන යන ලොරියක් පැදවිය හැකි විය යුතුයි<br>c) ෆෝර්ක් ලිෆ්ට් යන්ත්‍රයක් ක්‍රියා කරවිය හැකි විය යුතුයි.<br>d) බර වාහන වල නඩත්තුව පිළිබඳ මූලික අවබෝධයක් ලබා තිබිය යුතුයි.<br><br>**6. නළ කර්මාන්තකරු :**<br><br>ප්‍රායෝගික පරීක්ෂණය පහත සඳහන් විෂය ක්ෂේත්‍ර දෙකකින් සමත් විය යුතුයි.<br>a) උණුසුම් සහ සීතල ජල සැපයුම් නළ සවි කිරීම සහ නඩත්තුව<br>b) මල අපද්‍රව්‍ය පද්ධති සවි කිරීම සහ නඩත්තුව<br>c) විල් ජල නළ සවිකිරීම සහ නඩත්තුව<br>d) වාෂ්ප පයිප්ප පද්ධති සවි කිරීම සහ නඩත්තුව<br>e) සම්පීඩන වායු නළ පද්ධති සවි කිරීම සහ නඩත්තුව<br>f) ගිනි නිවන උපකරණ සහ උපාංග සවි කිරීම සහ නඩත්තු කිරීම<br>g) ගෑස් සපයන නළ පද්ධති සවි කිරීම සහ නඩත්තුව<br>h) පොම්ප සවි කිරීම සහ නඩත්තුව<br><br>**7. යන්ත්‍ර ක්‍රියාකරු (නිෂ්පාදන) :**<br><br>ප්‍රායෝගික පරීක්ෂණය පහත සඳහන් විෂය ක්ෂේත්‍ර දෙකකින් සමත් විය යුතුයි.<br>a) කම්මල් හැඩ තලන යන්ත්‍ර සහ පීඩක ක්‍රියාකරවීම *සහ* දෛනිකව නඩත්තු කළ හැකි විය යුතුයි.<br>b) බෝල්ට් ඇණ හැඩ තලන යන්ත්‍ර ක්‍රියාකරවීම *සහ* නඩත්තු කිරීම කළ හැකි විය යුතුයි.<br>c) ද්‍රව පීඩක යන්ත්‍ර ක්‍රියාකරවීම *සහ* දෛනික නඩත්තු කළ හැකි විය යුතුයි.<br><br>**8. වාත්තුමල්කරු :**<br><br>ප්‍රායෝගික පරීක්ෂණය පහත සඳහන් විෂය ක්ෂේත්‍ර දෙකකින් සමත් විය යුතුයි.<br><br>a) කෝර ප්‍රින්ට් භාවිතා කිරීමට අදාළව දෙන ලද සැලසුමකට අනුව වාත්තු මලක් සෑදීම.<br>b) දෙනු ලබන සැලසුමකට අනුව ඕනෑම වර්ගයක වාත්තු මලක් සෑදීම. | පැය 01 | 100 | 40 |

10.2 *යෝග්‍යතා ඇගයීම් සම්මුඛ පරීක්ෂණය*

| *ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ* | *ලකුණු ලබා දෙන ක්‍රමය* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ එක් විෂයකට ලකුණු 04 බැගින් විෂයයන් 3 සඳහා ලකුණු 12 ක්ද | ලකුණු 12 |
| | පිළිගත් ආයතනයක වසරකට නොඅඩු ඩිප්ලෝමා හෝ ඊට ඉහළ සුදුසුකම් ලබා ඇති අයට ලකුණු 04 ක් | ලකුණු 04 |
| | පිළිගත් ආයතනයක වසරකට නොඅඩු සම්මත පැය ගණන සම්පූර්ණ කර ඇති සහතික පත්‍ර පාඨමාලා සඳහා ලකුණු 04 ක් | ලකුණු 04 |
| සේවා පළපුරුද්ද | පිළිගත් රජයේ ලියාපදිංචි ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ නියමිත පළපුරුද්ද ඉක්මවා යන (අවු.2) වසර 05ක් සඳහා එක් වසරකට ලකුණු 08ක් බැගින් | ලකුණු 40 |
| පුහුණු පාඨමාලා හදාරා තිබීම | සුදුසුකම් ඉල්ලුම් කරනු ලබන ක්ෂේත්‍රයේ මාස 06 කට නොඅඩු පුහුණු පාඨමාලා සඳහා ලකුණු 10 ක්ද යාන්ත්‍රික ඉංජිනේරු ක්ෂේත්‍රයේ වෙනත් පුහුණු පාඨමාලා සඳහා ලකුණු 05ක් ද ලබාදේ. | ලකුණු 15 |
| විෂය බාහිර ක්‍රියාකාරකම් | ක්‍රීඩා සහතික සඳහා පළාත් මට්ටමේ ජයග්‍රහණ සඳහා ලකුණු 05ක් ද, සමස්ත ලංකා මට්ටමේ ජයග්‍රහණ සඳහා ලකුණු 10ක්ද (1ක් හෝ වැඩි ප්‍රමාණයක් සඳහා) පාසලේ ශිෂ්‍ය නායක තනතුරු සඳහා ලකුණු 05 ක් හිමිවේ. | ලකුණු 20 |
| සම්මුඛ පරීක්ෂණයේ දී පෙන්වන කුසලතාවය | සම්මුඛ පරීක්ෂණයේ දක්වන කුසලතාවය අනුව ලකුණු ලබාදේ. | ලකුණු 05 |
| එකතුව | | 100 |

**සටහන** :- තනතුරට ලබා දී ඇති පළපුරුද්ද පිළිගත හැකි සහතික මගින් සනාථ කළ යුතුය. එම සුදුසුකම් අයදුම්පත් කැඳවන අවසාන දිනට වලංගු විය යුතුය.

11.0 ඉල්ලුම් පත්‍රය පිරවීමේ දී ඉතා සැලකිලිමත් ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. සුදුසුකම් පරීක්ෂා කිරීමේ දී යම් අපේක්ෂකයෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවෙකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කළ හැක.

12.0 අත්සන සහතික කිරීම :-

අයදුම්පත්‍රයේ ද, විභාගය සඳහා ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් ආයතනයකින් විභාගයට ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා ද, එසේ නොවන අයදුම්කරුවකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියෙකු/විශ්‍රාමික නිලධාරියෙකු, කොට්ඨාශයේ ග්‍රාම නිලධාරිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතීඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියකු, රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්වයක් දරන අයෙකු ලවා සහතික කර ගත යුතුය. දැනටමත් රාජ්‍ය ආයතනයක සේවය කරන අයදුම්කරුවන් තම ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත් යොමු කළ යුතුය.

13.0 නියමිත ආදර්ශ ආකෘතියට අනුකූලව අයදුම්පත්‍රය ඉදිරිපත් කළ යුතුය. නිවේදනයේ ඇතුළත් ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන හා අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

14.0 මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත දිනට හෝ එදිනට පෙර හෝ ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කර ඇති සියලු අයදුම්කරුවන් රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල් විසින් වෘත්තීය ප්‍රායෝගික හා යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. එහෙත් එසේ කැඳවීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

15.0 අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් ඉදිරිපත් කළ යුතුය. ៖

**I.** පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත,
**II.** වලංගු විදේශ ගමන් බලපත්‍රය.

16.0 මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් පොදු නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

17.0 ඉල්ලුම් කළ යුතු පිළිවෙල ៖-

සියලු විස්තර ඇතුළත් කරමින් මේ සමග ඇති ආදර්ශ අයදුම් පත්‍රයට අනුව සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍රය අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් හා සේවා පළපුරුද්ද, පුහුණු පාඨමාලා, විෂය බාහිර ක්‍රියාකාරකම් සනාථ කරන සහතික වල පිටපත් ද සමග **2024.06.30** දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "අධ්‍යක්ෂ ජනරාල්, රජයේ කර්මාන්ත ශාලා දෙපාර්තමේන්තුව, කොලොන්නාව පාර, කොලොන්නාව" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත් බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ "ප්‍රාථමික ශිල්පීය සේවා ගණයේ **III** වන ශ්‍රේණියට විවෘත බඳවා ගැනීම - (2024)" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය.

ඉංජි. ඒ. විජේසිංහ,
අධ්‍යක්ෂ ජනරාල්,
රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව.

2024 මැයි මස 08 වැනි දින,
රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව,
කොලොන්නාව පාර, කොලොන්නාව.

ආදර්ශ අයදුම්පත්‍රය

රජයේ කර්මාන්ත ශාලා දෙපාර්තමේන්තුව
ප්‍රාථමික ශිල්පීය සේවා ගණයේ තනතුරු සඳහා විවෘත බඳවා ගැනීම

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

අයදුම්කරන භාෂා මාධ්‍යය ៖

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4

ඉල්ලුම් කරන තනතුර හෝ තනතුරු ៖-

| *අනු. අංකය* | *තනතුර* | *අනු. අංකය* | *තනතුර* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

1. මුලකුරු සමග නම :————.

2. සම්පූර්ණ නම :————.

3. ජාතික හැඳුනුම්පත් අංකය :

4. ස්ථිර ලිපිනය :————.

5. උපන් දිනය :- වර්ෂය  මාසය  දිනය

6. දුරකථන අංකය :

7. අධ්‍යාපන සුදුසුකම් :

7.1 අ. පො. ස. (සා. පෙළ) විභාගය පිළිබඳ විස්තර :

විභාග අංකය :

1. පළමුවර ප්‍රතිඵල වර්ෂය :............................ මාසය :........................

| විෂයය | ශ්‍රේණිය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

විභාග අංකය :

II. දෙවන වර ප්‍රතිඵල : වර්ෂය:..................... මාසය :..........................

| විෂයය | ශ්‍රේණිය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

8. අතිරේක අධ්‍යාපන සුදුසුකම් :

8.1 අ.පො. ස. (උ. පෙළ) විභාගය පිළිබඳ විස්තර

i. විභාගයේ වර්ෂය සහ මාසය :————.

ii. විභාග අංකය :————.

ප්‍රතිඵල

| විෂයය | ශ්‍රේණිය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

8.2 ඩිප්ලෝමා/සහතික පත්‍ර පාඨමාලා :
..........................................................................................................
..........................................................................................................
..........................................................................................................
..........................................................................................................

9. වෘත්තීය සුදුසුකම් : ..........................................................................
..........................................................................
..........................................................................
..........................................................................
..........................................................................
..........................................................................

10. තනතුරට අදාළව ලබා ඇති සේවා පළපුරුද්ද :
..........................................................................
..........................................................................
..........................................................................
..........................................................................
..........................................................................
..........................................................................

11. හදාරා ඇති පුහුණු පාඨමාලා :
..........................................................................
..........................................................................
..........................................................................
..........................................................................
..........................................................................
..........................................................................

12. විෂය බාහිර ක්‍රියාකාරකම් :
..........................................................................
..........................................................................
..........................................................................
..........................................................................

13. දැනට කිසියම් තනතුරක් දරන්නේ නම් ඒ පිළිබඳ විස්තර :
i. තනතුර හා ශ්‍රේණිය :————.
ii. පත් වූ දිනය :————.
iii. ආයතනය :————.
iv. විශ්‍රාම වැටුප් සහිත ස්ථිර තනතුරක් ද යන වග :————.

14. ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද?

(අදාළ කොටුවෙහි ✓ ලකුණ යොදන්න. ඔව් නම් විස්තරය සඳහන් කරන්න)

| ඔව් | නැත |
|---|---|
| ☐ | ☐ |

15. අයදුම්කරුගේ සහතිකය :

(අ) මෙම ඉල්ලුම් පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදු විය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තවද මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බවද ප්‍රකාශ කරමි.

(ආ) මා විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවද මම දනිමි.

(ඇ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

16. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම ඃ

මෙම අයදුම්පත ඉදිරිපත් කර ඇති ........................ නැමති අය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත් .................................... දින ඔහු/ඇය මා ඉදිරිපිට අත්සන් තබන ලද බවත් සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන.

දිනය :————.

සහතික කරන්නාගේ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
නිල මුද්‍රාව :————.

17. රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ සේවකයෙකු නම්, දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය ඃ

........................ මහතා/මහත්මිය/මෙනවිය මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ ස්ථිර සේවකයකු/සේවිකාවක ලෙස සේවය කරන බවත්, මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් දන්වමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා
නිල මුද්‍රාව.

දිනය :————.

සහතික කරන්නාගේ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
නිල මුද්‍රාව :————.

05-182

## අයදුම්පත් භාරගන්නා අවසාන දිනය දීර්ඝ කිරීම

### රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

උප්පැන්න හා මරණ හා විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය දීර්ඝ කිරීම

අංක 2376 හා 2024.03.15 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* නිවේදනය කර තිබූ මහනුවර දිස්ත්‍රික්කයට අද ාළ සියලුම උප්පැන්න, මරණ හා විවාහ රෙජිස්ට්‍රාර් ධුරයන්හි පුරප්පාඩු තනතුරුවලට අදාළ අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය **2024.06.15** දින දක්වා දීර්ඝ කෙරෙන බව මෙයින් නිවේදනය කරමි.

02. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය හැර අයදුම්පත් කැඳවීමේ දැන්වීමෙහි සඳහන් අනෙකුත් කරුණු සියල්ලම එලෙසම බලපවත්වන බවද කරුණාවෙන් සලකන්න.

ඩබ්. ආර්. ඒ. එන් එස්. විජයසිංහ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
කොස්වත්ත, බත්තරමුල්ල.

05-208

---

## විභාග, විභාග ප්‍රතිඵල ආදිය

සංශෝධනයයි

### කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

**ශ්‍රී ලංකා සත්ත්ව පාලන විද්‍යාලවලට ඇතුළත් වීම සඳහා පැවැත්වෙන තරග විභාගය - 2024**

2024/2026 අධ්‍යයන වර්ෂය සඳහා පශු සම්පත් නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව

2024/2026 අධ්‍යයන වර්ෂය සඳහා පශු සම්පත් නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව සඳහා නවක සිසුන් බඳවා ගැනීම සඳහා පැවැත්වෙන තරග විභාගය සඳහා අයදුම්පත් කැඳවන ලද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2024.01.26 දිනැති *ගැසට් පත්‍රයේ* පළ වූ නිවේදනයේ 3.1 (අ)/(ආ)/(ඇ) ඡේද වල සඳහන් "සිංහල භාෂාව හා සාහිත්‍යය /දෙමළ භාෂාව හා සාහිත්‍යය, ගණිතය, විද්‍යාව හා තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයක් ද, ඉංග්‍රීසි විෂයය සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ද සහිතව එකවර විෂයයන් හයකින් (6) කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්වීම" යන්නට

"සිංහල භාෂාව හා සාහිත්‍යය / දෙමළ භාෂාව හා සාහිත්‍යය, ගණිතය, විද්‍යාව හා තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයක් ද ඉංග්‍රීසි විෂයය සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ද සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්වීම" යනුවෙන් ද,

4.3 ඡේදයෙහි සඳහන් "අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය **2024 පෙබරවාරි 26 දින**" යන්න, "අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය **2024 ජූනි 10 දින**" යනුවෙන් ද සංශෝධනය කරමි.

02. එම *ගැසට්* නිවේදනයෙහි සඳහන් අනෙකුත් උපදෙස්වල වෙනසක් සිදු නොවේ.

ආචාර්ය කේ. ඒ. සී. එච්. ඒ. කොතලාවල,
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්.

2024 මැයි මස 08 වැනි දින.
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව.
ගැටඹේ, පේරාදෙණිය.

05-199

සංශෝධනයයි

**අධ්‍යාපන අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE) 2023/2024 අධ්‍යයන වර්ෂය සඳහා උසස් තාක්ෂණ ආයතනවලට සිසුන් බඳවා ගැනීම

මෙය 2024.04.26 දින ප්‍රකාශයට පත් කරන ලද ගැසට් නිවේදනයට අමතරවය.

ත්‍රිකුණාමලය උසස් තාක්ෂණ ආයතනයේ (ATI) උසස් ජාතික තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව (පූර්ණ කාලීන) HNDIT (FT) සඳහා දැන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් කැඳවීම apply.sliate.ac.lk වෙබ් අඩවිය මගින් පමණක් මාර්ගගතව සිදු කළ යුතු අතර, වෙනත් ඕනෑම ආකාරයකින් අයදුම් කිරීම පිළිගනු නොලැබේ.

අනෙකුත් සියලුම උපදෙස් 2024.04.26 දින ප්‍රකාශයට පත් කරන ලද ගැසට් නිවේදනයට සමාන වේ.

| | | | |
|---|---|---|---|
| Advanced Technological Institute - Trincomalee | Kanniya Rd, Varothayanagar, Trincomalee | 026-2223232 | HNDA (FT), HND in English (FT), HNDA (PT), HNDIT (FT), HNDIT (PT), HND in English (PT) |

අධ්‍යක්ෂ ජනරාල්.

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය,
(SLIATE)

05-247

---

## ජනමාධ්‍ය අමාත්‍යාංශය

**රැකියා සුලභ මුද්‍රණ සහ ග්‍රැෆික්ස් ක්ෂේත්‍රයට පිවිසෙන්න**

## ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය

ISO තත්ත්ව සහතිකයෙන් පිදුම්ලත් ආයතනයකි

**ග්‍රැෆික්ස්, මල්ටිමීඩියා සහ මුද්‍රණ පාඨමාලා - 2024 වර්ෂය**

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පාඨමාලා හදාරා මුද්‍රණ, ග්‍රැෆික්ස් සහ මල්ටිමීඩියා ක්ෂේත්‍රයේ නිපුණයෙකු වන්න.

**පාසල් හැරගිය සිසුන් සඳහා ඕෆ්සෙට් ලිතෝ මුද්‍රණකරණය පිළිබඳ පූර්ණකාලීන NVQ පාඨමාලාව**
**NVQ Training Programme in Offset Lithopress Operation for School Leaves (Full time)**

අද දිවයිනේ ඉහළ රැකියා ඉල්ලුමක්ව පවතින ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරුවන් පුහුණු කිරීමේ පූර්ණකාලීන පාඨමාලාවක් වන මෙම පුහුණු වැඩසටහන තුළින් ඕෆ්සෙට් ලිතෝකරණය (Offset Lithography) Sheet Fed සහ Stream Feeder ලිතෝ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරවීම ඇතුළු ඕෆ්සෙට් මුද්‍රණකරණයට අදාළ ප්‍රායෝගික හා න්‍යායාත්මක දැනුම හා පුහුණුව ලබාදේ. පුහුණුව අවසාන කිරීමෙන් පසු ඔවුන් රැකියා සඳහා අනුයුක්ත කෙරේ.

මාධ්‍යය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 30,000

---

**මයික්‍රොසොෆ්ට් ඔෆීස් - Microsoft Office**

මෙම පාඨමාලාව තුළින් MS Office පිළිබඳ පූර්ණ අවබෝධයක් සහ පුහුණුවක් ලබා දෙන අතර, පරිගණක භාවිතය පිළිබඳව ද මූලික දැනුම හා අවබෝධය ද ලබා දේ. මෙම පාඨමාලාව පාසල් හැරගිය නවකයන්ට මෙන්ම ආයතනවල රැකියාවන්හි නියුතු පුද්ගලයන්ට ද

MS Office පිළිබඳව පූර්ණ දැනුම හා අවබෝධය ලබා දේ.

පාඨමාලා කාලය : මාස 05 යි (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල සහ ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 22,000

### පරිගණක ආශ්‍රිත ග්‍රැෆික් නිර්මාණකරණය - **Computer Graphic Design**

ග්‍රැෆික්, මුද්‍රණ හා මල්ටිමීඩියා ක්ෂේත්‍රයේ පවතින ඉහළ රැකියා ඉල්ලුමට සරිලන ලෙස මෙම පාඨමාලාව සකස් කර ඇති අතර, ඒ තුළින් අද ග්‍රැෆික් නිර්මාණයට අවශ්‍ය සියලු මෘදුකාංග පිළිබඳ පුළුල් පුහුණුවක් ලබා දෙයි. මෙම පාඨමාලාව පාසල් හැරගිය සිසුන්ට හා ග්‍රැෆික් ක්ෂේත්‍රයේ නියැළෙන පුද්ගලයන්ට මනා දැනුම ද, පුහුණුව ද ලබා දේ.

පාඨමාලා කාලය : මාස 06 (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි

පාඨමාලා ගාස්තුව : ආයතනික සහතිකපත් පාඨමාලාව රු. 25,000 NVQ සහතිකපත් පාඨමාලාව රු. 45,000

### පරිගණක ආශ්‍රිත අකුරු ඇමිණීම සහ පිටු සැකසීම - **Computer Typesetting and Desktop Publishing**

මෙම පාඨමාලාවට ඉතා ඉහළ ඉල්ලුමක් පවතින අතර මුද්‍රණ, ග්‍රැෆික්ස්, ප්‍රචාරක හා ප්‍රකාශන ක්ෂේත්‍රයේ පවතින ඉහළ රැකියා ඉල්ලුමට සරිලන පාඨමාලා අන්තර්ගතයකින් සකස්වන අතර ග්‍රැෆික්, ප්‍රචාරක, මුද්‍රණ සහ ප්‍රකාශන ක්ෂේත්‍රයන්ට ඇතුළත් වීමට බලාපොරොත්තුවන නවකයින් සඳහා විශේෂයෙන් සැකසුණු පාඨමාලාවකි.

පාඨමාලා කාලය : මාස 06 යි (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 22,000

### වෙබ් අඩවි නිර්මාණය - **Web Designing**

මෙම පාඨමාලාව තුළින් වෙබ් අඩවි නිර්මාණය පිළිබඳ නවීන තාක්ෂණයට අනුකූලව පුළුල් අවබෝධයක් සහ පුහුණුවක් ලබා දේ. පරිගණක ක්ෂේත්‍රයේ නියැළි පුද්ගලයන්ට හා මෙම ක්ෂේත්‍රයට ඇතුළත් වීමට අදහස් කරන නවකයන්ට ද මෙම පාඨමාලාව ඉමහත් ප්‍රයෝජනවත් වේ.

පාඨමාලා කාලය : මාස 05 යි (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 25,000

### පොත් බැඳීම හා නිමාකරණය - **Book Binding & Finishing**
### පොත් බැඳීම - **Book Binding - NVQ 4**

මෙම පාඨමාලාවට ඉතා ඉහළ ඉල්ලුමක් ඇත. මේ තුළින් පොත් බැඳීම, නිමාව පිළිබඳ පුළුල් අවබෝධයක්, න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව මේ තුළින් ලබාදේ. මෙම පාඨමාලාව පාසල් හැරගිය සිසුන්ට මෙන්ම ක්ෂේත්‍රයේ නියැළි පුද්ගලයන්ට ද මහත් ප්‍රයෝජනයකි.

පාඨමාලා කාලය : මාස 06 - මාස 08 මාධ්‍යය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 40,000
NVQ පාඨමාලාව : රු. 65,000

### අරේඛීය සංස්කරණය - **Non Linear Editing**

මෙම පාඨමාලාව තුළින් රූපවාහිනී වැඩසටහන් සංස්කරණය සහ පිටපත් රචනය පිළිබඳ පූර්ණ ප්‍රායෝගික සහ න්‍යායාත්මක අවබෝධය ලබාදේ. පාසල් හැරගිය සිසුන්ට ද වීඩියෝ, රූපවාහිනී, චලන රූප කර්මාන්තයේ සහ ඉලෙක්ට්‍රොනික් සන්නිවේදන හා චිත්‍රපට කර්මාන්තයේ නිරතවූවන් හට ද මෙම පාඨමාලාව ඉමහත් ප්‍රයෝජනවත් වේ.

පාඨමාලා කාලය : මාස 06 (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල/ ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 40,000

### ත්‍රිමාණ සජීවීකරණය - **Digital Animation**

මෙම පාඨමාලාව තුළින් පරිගණක ආධාරයෙන් ද්විමාන සහ ත්‍රිමාණ චලන රූප නිර්මාණකරණය කිරීම සහ එම රූප, රූපවාහිනී සහ චිත්‍රපට මාධ්‍ය සඳහා යොදා ගන්නා අයුරු සවිස්තරාත්මකව පුහුණු කෙරේ.

පාඨමාලා කාලය : මාස 06 (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල සහ ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 40,000

### පරිගණක දෘඩාංග එකලස් කිරීම සහ සැකසීම - **Computer Hardware & PC Assembly**

මෙම පාඨමාලාව තුළින් පරිගණක දෘඩාංග/මෘදුකාංග සහ පරිගණක එකලස් කිරීම පිළිබඳව මනා දැනුමක් සහ අවබෝධයක් ලබා දෙන අතර, එදිනෙදා පැන නගින දෘඩාංග/මෘදුකාංගවලට අදාළ තාක්ෂණික හා ප්‍රායෝගික ගැටළු විසඳා ගැනීමට මහත් සේ මෙම

පාඨමාලාව ප්‍රයෝජනවත් වේ. නවකයන්ට මෙන් ම පරිගණක තාක්ෂණයේ නියැළි පුද්ගලයන්ට ද මෙම පාඨමාලාව එකසේ ප්‍රයෝජනවත් වනු ඇත.

පාඨමාලා කාලය : මාස 04 යි (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල/ ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු.25,000

---

**ඕෆ්සෙට් ලිතෝකරණය - Offset Lithography**

මෙම පාඨමාලාව තුළින් අද ප්‍රචලිතව පවතින ඕෆ්සෙට් මුද්‍රණ තාක්ෂණය සහ ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරණය පිළිබඳව පූර්ණ අවබෝධයක් සහ දැනුමක් ලබා දේ. ඕෆ්සෙට් මුද්‍රණ ක්ෂේත්‍රයේ නියැළි පුද්ගලයන්ට මෙන් ම එම ක්ෂේත්‍රයට ඇතුළත්වීමට අදහස් කරන නවකයන්ට ද මෙම පාඨමාලාව මහත් ප්‍රයෝජනවත් වේ.

පාඨමාලා කාලය : වසර 01 යි (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 35,000

---

**නවීන වර්ණ 4 මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරණය පිළිබඳ පුහුණු පාඨමාලාව**
**Modern Four Colour Offset Printing Machine Operation**

මෙම පාඨමාලාවේ අරමුණ වනුයේ නවීනතම සිව් වර්ණ ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර පිළිබඳ පුළුල් වපසරියක පුහුණුවක් ලබා දී ඒ තුළින් යන්ත්‍ර ස්වාධීනව ක්‍රියාකරවීමට සහ තත්ත්වයෙන් උසස් ගුණාත්මක ප්‍රතිඵල ලබාගැනීම සඳහා සහභාගිවන්නවුන් පුහුණු කිරීමය. සියලුම පුහුණුකරුවන්ට නවීනතම Heidelberg Speed Master Offset මුද්‍රණ යන්ත්‍රයක පුහුණුව ලබා දේ. විදෙස්ගත රැකියා සඳහා යොමුවන මුද්‍රණකරුවන්ට මෙම පාඨමාලාව මහත් ඵලදායී පුහුණුවක් ලබා දේ.

පාඨමාලා කාලය : මාස 03යි (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 35,000

---

**ඩිජිටල් මුද්‍රණ තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව - Certificate Course on Digital Printing Technology**

මෙම පාඨමාලාවේ පරමාර්ථය වනුයේ නවීනතම මුද්‍රණ තාක්ෂණය වන ඩිජිටල් මුද්‍රණ තාක්ෂණය පිළිබඳ පූර්ණ න්‍යායාත්මක සහ ප්‍රායෝගික දැනුම ලබා දී ඒ තුළින් එම ක්ෂේත්‍රයට පිවිසීමට අවශ්‍ය පුළුල් තාක්ෂණික/ප්‍රායෝගික පුහුණුව සහ අවබෝධය ලබා දීමය.

පාඨමාලා කාලය : මාස 04 යි (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 25,000

---

**ග්‍රැෆික් ඩිසයින් පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - Diploma in Graphic Design**

මෙම පාඨමාලාව මගින් ග්‍රැෆික් නිර්මාණකරණය, කළමනාකරණය සහ මෘදුකාංග ඇතුළුව නිර්මාණ සංකල්ප සහ යෙදීම් පිළිබඳ උසස් මට්ටමේ ප්‍රායෝගික සහ න්‍යායාත්මක පුහුණුවක් ලබා දේ. ග්‍රැෆික්ස් නිර්මාණකරණයට අදාළ මෘදුකාංග භාවිතයෙන් සාර්ථක නිර්මාණ බිහි කිරීමේ නිපුණතාවයන් වර්ධනය වන අයුරින් මෙහි විෂය මාලාව සකස්කර ඇති අතර, මෙම පාඨමාලාව හැදෑරීමෙන් ඔබට පරිපූර්ණ ග්‍රැෆික්ස් නිර්මාණකරුවෙකු විය හැක.

කාලය : වසර 01යි (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 70,000

---

**වෙබ් අඩවි නිර්මාණය - Certificate Course in Web Design**

මෙම පාඨමාලාව තුළින් වෙබ් අඩවි නිර්මාණකරණය පිළිබඳ නවීන තාක්‍ෂණයට අනුකූලව වෙබ් අඩවියක් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය පුළුල් දැනුමක් සහ ප්‍රායෝගික පුහුණුවක් ලබා දේ. මෙම පාඨමාලාව නවකයන්ට ද මාධ්‍ය ක්‍ෂේත්‍රයේ සේවය කරන සියලු දෙනාටම ඉමහත් ප්‍රයෝජනවත් පාඨමාලාවකි.

පාඨමාලා කාලය : මාස 05 (අර්ධකාලීන) මාධ්‍ය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 25,000

---

**ඩිජිටල් පෙර මුද්‍රණය - Certificate Course in Digital Pre Press**

මෙම පාඨමාලාව තුළින් පෙර මුද්‍රණ තාක්‍ෂණයට අදාළ මෘදුකාංග සහ අනෙකුත් මුද්‍රණ තාක්‍ෂණයට අදාළ ඩිජිටල් ක්‍රියාවලියන් පිළිබඳ පූර්ණ අවබෝධයක් සහ ප්‍රායෝගික පුහුණුවක් ලබා දේ.

පාඨමාලා කාලය : වසර 01යි (අර්ධකාලීන) මාධ්‍ය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 35,000

---

**පිරිවැය හා ඇස්තමේන්තුකරණය - Certificate Course in Costing & Estimating**

මෙම පාඨමාලාව තුළින් මුද්‍රණ ක්ෂේත්‍රයේ පිරිවැයකරණය සමග ඇස්තමේන්තුකරණය පිළිබඳ පූර්ණ දැනුමක් සහ අවබෝධයක් ලබාදේ. මුද්‍රණ ක්ෂේත්‍රයේ නියැලි පුද්ගලයන්ට ද එම ක්ෂේත්‍රයට ඇතුළත් වන නවකයන්ට ද ඉමහත් ප්‍රයෝජනවත් පාඨමාලාවකි.

පාඨමාලා කාලය : වසර 01 යි (අර්ධකාලීන) මාධ්‍ය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 35,000

**ඩිජිටල් මුද්‍රණ තාක්‍ෂණය හා සිව් වර්ණ ඕෆ්සෙට් මුද්‍රණ තාක්‍ෂණය පිළිබඳ ද්විත්ව පුහුණු පාඨමාලාව**

**Training Programme in Digital Printing Technology and Multi Colour Offset Printing Technology**

මෙම පාඨමාලාව තුළින් නවතම ඩිජිටල් මුද්‍රණ තාක්‍ෂණය සහ සිව් වර්ණ ඕෆ්සෙට් මුද්‍රණ තාක්‍ෂණය පිළිබඳ නවීනතම යන්ත්‍ර ආශ්‍රයෙන් පුහුණු කරනු ලැබේ. විදේශ රැකියා අපේක්ෂිත තරුණයන් සඳහා ම මෙම පාඨමාලාව විශේෂයෙන් ම සැකසී ඇත.

සීමිත සිසුන් සංඛ්‍යාවක් පමණක් මෙම පුහුණු පාඨමාලාව සඳහා බඳවා ගනු ලැබේ.

පාඨමාලා කාලය ෑ මාස 04 යි (අර්ධකාලීන) මාධ්‍ය ෑ සිංහල පාඨමාලා ගාස්තුව ෑ රු. 40,000

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පාඨමාලා සියල්ල උසස් ප්‍රමිතියකට අනුව ක්ෂේත්‍රයේ රැකියාවලට ගැළපෙන අයුරින් සකස්කොට ඇති අතර, පාඨමාලා සාර්ථකව නිමකරන සිසුන්හට රජය හා ජාත්‍යන්තරව පිළිගත් වටිනා සහතික පත්‍රයක් ප්‍රදානය කෙරේ.

**පාඨමාලා අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය,**
**ජනමාධ්‍ය අමාත්‍යාංශය,**
**රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,**
**අංක 118, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08.**

**දුරකතන ෑ 011 2686162, 011 2679791, 071 9716655, 077 7706995**
**ෆැක්ස් ෑ 011 2686162**
**ඊ-මේල් ෑ sliopdir@sltnet.lk**
**වෙබ් අඩවිය ෑ www.sliop.edu.lk**

**ශාඛා ෑ ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය, මාතලේ ශාඛාව,**
**දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතලේ.**
**දුරකතන අංක ෑ 066 2222172, 071 0554298.**

05-000

---

**සෞඛ්‍ය අමාත්‍යාංශය**

වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවට අයත් වාග් චිකිත්සක තනතුරට

උපාධිධාරීන් බඳවා ගැනීම - 2024

සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පාලනයවන රෝහල් සහ පළාත් සහා යටතේ පාලනයවන රෝහල් හි වාග් චිකිත්සක තනතුරේ III ශ්‍රේණියේ පවතින පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. *බඳවා ගැනීමේ ක්‍රමය ෑ-*

   සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ වාග් චිකිත්සක තනතුරේ පවත්නා පුරප්පාඩු 29ක් සම්පූර්ණ කිරීම සඳහා අදාළ විෂය ක්ෂේත්‍රයේ උපාධිය සම්පූර්ණ කරන ලද උපාධිධාරීන් අතරින් ලිඛිත විභාගයක් පවත්වා බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ.

2. *තනතුරට අදාළ අධ්‍යාපන හා වෙනත් විශේෂ සුදුසුකම් ෑ-*

   විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් කථන හා භාෂා චිකිත්සාව පිළිබඳව උපාධියක් ලබා තිබීම.

   ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ (SLMC) ලියාපදිංචිය ලබා තිබීම.

3. *අනෙකුත් පොදු සුදුසුකම්* :-

(අ) සෑම අපේක්ෂකයෙකු ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරී ඉටු කිරීමටත්, ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(ආ) ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

(ඇ) අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

(ඉ) ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම අයදුම් කළ හැකිය.

(ඊ) 2024.06.07 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා වයස අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

(උ) අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට සඳහන් කරනු ලබන දිනට සියලු සුදුසුකම් සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතුය. (අදාළ උපාධිය බලපැවැත්වෙන දිනය (Effective Date) අයදුම්පත් භාර ගන්නා අවසාන දින හෝ ඊට පෙර දිනයක් විය යුතුය).

4. *බඳවා ගැනීමේ ලිඛිත විභාගය* :-

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතුරින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් හෝ ඔහු විසින් බලය පවරනු ලබන ආයතනයක් විසින් සාමාන්‍ය දැනීම සහ බුද්ධි පරීක්ෂණය පිළිබඳ ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලබන ලිඛිත විභාගයේ දී ලබා ගත් ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව අපේක්ෂකයින් කායික යෝග්‍යතාව සහ සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයට යොමු කිරීමෙන් පසුව භාණ්ඩාගාර ලේකම්ගේ අංක DMS/0016/2024 VOl.I හා 2024.02.29 දිනැති ලිපිය මඟින් අනුමැතිය ලබා දී ඇති ප්‍රමාණය පමණක් බඳවා ගනු ලැබේ.

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂයය නිර්දේශය* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රතිශතය* |
|---|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පද සංඛ්‍යා හා රූප වශයෙන් ඉදිරිපත් කරනු ලබන ගැටලු සම්බන්ධයෙන් අපේක්ෂකයෝ දක්වන නිගමන හා ප්‍රතිචාර ආශ්‍රයෙන් එම ගැටලු පිළිබඳ අර්ථාවබෝධය, ප්‍රමාණීකරණය හා කාලය හා අවකාශය අතර සහ සම්බන්ධතා වටහා ගැනීමෙහි ලා අපේක්ෂකයෙකු සතු හැකියාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ. | පැය 01 | 100 | 40 |
| සාමාන්‍ය දැනීම | වාග් චිකිත්සක තනතුරට අදාළ විෂය දැනුම අදාළ කර තර්කානුකූල කරුණු දැක්වීම සහ සාමාන්‍ය දැනුම පරීක්ෂා කිරීම | පැය 01 | 100 | 40 |

5. *සම්මුඛ පරීක්ෂණය* :-

බඳවා ගැනීමේ තරඟ විභාගයේ අදාළ ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටි අයදුම්කරුවන් අතරින් ප්‍රශ්න පත්‍රය සඳහා 40% හෝ ඊට වැඩි ලකුණු ලබාගත් අයදුම්කරුවන් පමණක්, ලබා ඇති ලකුණු කුසලතා අනුපිළිවෙල අනුව සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලබන අතර, එම සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනය සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් විසින් තීරණය කරනු ලැබේ. තව ද මෙම සම්මුඛ පරීක්ෂණයට පැමිණෙන සියලුදෙනාම වාග් චිකිත්සක තනතුරට බඳවා ගන්නා බවක් මෙහි අඩංගු වගන්ති කිසිවකින් අදහස් නොවන අතර එසේ තේරුම් ගත යුතු ද නොවේ.

***සටහන*** :- සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් පවත්වන අතර, සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් වාග් චිකිත්සක තනතුරට අදාළ බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් සුදුසුකම් පරීක්ෂා කිරීම සහ කායික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම සිදු කරනු ලැබේ. එසේ ම උපාධිධාරීන් බඳවා ගැනීමට අදාළව අවසන් වරට නිකුත් කරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2,101 හා 2018.12.07 දිනැති *ගැසට්* නිවේදනය ප්‍රකාරව අයදුම්පත් ඉදිරිපත් කිරීමේ අවසන් දිනය වූ **2019.01.07** දිනට පසුව උපාධිය ලබා ඇති අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.

6. ***අයදුම් කළ යුතු ආකාරය*** :-

(අ) මේ සමග ඇති ආදර්ශ අයදුම්පතේ ආකෘතිය අනුව ස්වකීය අයදුම්පත සකස් කළ යුතු අතර ඒ සඳහා A4 ප්‍රමාණයේ කඩදාසි භාවිතා කළ යුතුය.

(ආ) උපාධි සහතිකයේ හා GPA අගය දැක්වෙන සහතිකයේ තමා විසින් සත්‍ය බවට සහතික කළ පිටපතක් සමග ඉදිරිපත් කළ යුතුය.

(ඇ) අයදුම්පතේ "ලදුපත" ස්ථානයේ, ලංකා බැංකුව, තැප්‍රොබේන් ශාඛාවේ අංක **7041318** දරන "**සෞඛ්‍ය ලේකම් විභාග ගාස්තු රැස්කිරීම**" යන ගිණුමට රු.1000.00 ක් බැරකර එම ලදුපත නොගැලවෙන සේ ඇලවිය යුතුය. (ලදුපත ඇලවීමට පෙර එහි පිටපතක් තබා ගන්න)

(ඈ) අයදුම්පත්‍රයේ අයදුම්කරුගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු හෝ සාමදාන විනිශ්චකාරවරයෙකු හෝ දිවුරුම් කොමසාරිස්වරයෙකු හෝ නීතීඥවරයෙකු හෝ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු හෝ ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු හෝ පොලිස් සේවයේ *ගැසට්* කරන ලද තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු. 393,684 ට වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් සහතික කල යුතුය.

(ඉ) නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් අගල් 9 x 4 ප්‍රමාණයේ ලියුම් කවරයක බහා එම කවරයේ ඉහළ කෙළවරේ "පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ වාග් චිකිත්සක තනතුර සඳහා උපාධිධාරීන් බඳවා ගැනීම - 2024" වශයෙන් හා අදාළ උපාධිය හා අධ්‍යයන වර්ෂය ද සඳහන් කර **2024.06.07** දිනට පෙර ''අධ්‍යක්ෂ (පාලන) 02, සෞඛ්‍ය අමාත්‍යාංශය, සුවසිරිපාය, අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

***සටහන*** :- ඉහත 2 හා 3 යටතේ දැක්වෙන සුදුසුකම් හා අනෙකුත් සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය වන **2024.06.07** දිනට සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7. රජයේ හෝ අර්ධ රාජ්‍ය ආයතනවල නිලධාරීන්ගේ අයදුම්පත්, ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් එවිය යුතුය.

8. මෙම *ගැසට්* නිවේදනයේ දැක්වෙන නියමයන්ට අනුකූල නොවන, අසම්පූර්ණ, ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, මූලික සුදුසුකම් සම්පූර්ණ කර නොමැති, බැංකු ලදුපත අලවා නොමැති හා **2024.06.07** දින හෝ ඊට පෙර ලියාපදිංචි කර නොමැති අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන අතර අයදුම්පත් ලද බවද දන්වා එවනු නොලැබේ.

9. **අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය** :-

(අ) ලිඛිත පරීක්ෂණයට කැඳවනු ලබන්නේ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින්ව පමණි.

(ආ) ලිඛිත පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ රියදුරු බලපත්‍රය පිළිගනු ලැබේ.

10. **සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම**:-

වාග් චිකිත්සක තනතුර සඳහා බඳවා ගැනීමේ ලිඛිත විභාගයට පෙනී සිට එයින් සමත් වී අවශ්‍ය සුදුසුකම් සපුරන ලද සීමිත අයදුම්කරුවන්/අයදුම්කාරියන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර සම්මුඛ පරීක්ෂණයේ දී අදාළ අයදුම්කරුවන්/අයදුම්කාරියන් විසින් පහත දක්වා ඇති ලියවිලිවල මුල් පිටපත් හා එහි සහතික කරන ලද පිටපත බැගින් ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.

(1) උප්පැන්න සහතිකය,
(2) උපාධි සහතිකයේ මුල් පිටපත (සහතික කළ පිටපතක් අයදුම්පත සමග ද අමුණා එවිය යුතුය),
(3) ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ වලංගු රියදුරු බලපත්‍රය
(4) පදිංචිය සනාථ කිරීම සඳහා ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන ලද පදිංචිය පිළිබඳ සහතිකය (ග්‍රාම නිලධාරී සහතිකය)

11. **සේවයේ නියුක්ත කරවීමේ නියමයන්** :-

වාග් චිකිත්සක තනතුරේ ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීමට සෞඛ්‍ය අමාත්‍යාංශය තීරණය කළහොත් බඳවා ගැනීමේ පරිපාටියේ කොන්දේසි අනුව එම තනතුරේ III ශ්‍රේණියේ තනතුරකට පත් කිරීමට කටයුතු කරන අතර, ලිඛිත විභාගයේ කුසලතාවය

මත පත්වීම් ස්ථානය තීරණය කරනු ලැබේ. වාග් චිකිත්සක තනතුර සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව MT-6-2016 හි පරිදි රු. 32,080 - 445 x 10 - 660 x 11 - 730 x 10 - රු. 58,590 යන වැටුප් පරිමාණය හිමිවන අතර ගෙවීම් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි විධිවිධාන අනුව සිදු කරනු ලැබේ.

12. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් පිළිබඳ විස්තර අයදුම්පත පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව හා නිවැරදිව ඇතුලත් කළ යුතුය. පත්වීම ලැබීමෙන් පසු සුදුසුකම් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කර ඇති සහතික ව්‍යාජ බවට ඔප්පු වුවහොත්, නීත්‍යානුකූලව කටයුතු කරන අතර, දෙනු ලබන පත්වීම අවලංගු කර තනතුරින් පහකර ඒ සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කර නැවත රජයේ සේවයට නොගන්නවුන්ගේ අසාධු ලේඛනයට ඔහුගේ/ඇයගේ නම ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ.

13. තෝරාගත් අයදුම්කරුවන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කායික හා මානසික යෝග්‍යතාවයකින් හෙබි බව සනාථ කරනු පිණිස තනතුරට පත් වී පළමු මාසය ඇතුලත වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, වෛද්‍ය පරීක්ෂණයේ දී අයෝග්‍ය බව පෙනී යන අයදුම්කරුවන් තනතුරේ රැඳී සිටීමට නුසුදුස්සන් වනු ඇත.

14. ඉහත පරිදි බඳවා ගන්නා ලද සියලුදෙනා රජයේ නිලධාරීන්ට අදාළ වන සියලුනීතිරීති, ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට, සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නියම කරනු ලබන ප්‍රතිපත්තිවලට, මුදල් රෙගුලාසි හා වෙනත් රෙගුලාසිවලට ද රජය විසින් වරින් වර පනවනු ලබන නීතිරීති හා නියෝගයන්ට ද යටත් වනු ඇත.

15. මෙම *ගැසට්* නිවේදනය මගින් ආවරණය වන හෝ නොවන යම් කරුණක් සම්බන්ධයෙන් යම් ගැටලු සහගත තත්වයක් උදා වුවහොත් ඒ පිළිබඳව සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත. මෙම ගැසට් නිවේදනයේ සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් පරස්පරතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු වන්නේ ය.

වෛද්‍ය පී.ජී. මහීපාල,
ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යාංශය.

2024 මැයි මස 15 වැනි දින,
සෞඛ්‍ය අමාත්‍යාංශය,"සුවසිරිපාය",
අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

**ආදර්ශ අයදුම්පත**

*වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ වාග් චිකිත්සක තනතුර සඳහා*
*උපාධිධාරීන් බඳවා ගැනීම - 2024*

(අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර ගැසට් නිවේදනය හොඳින් කියවා බලන්න)

1. (අ) මුලකුරු සමග අගට යෙදෙන නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා. A.B.C. SILVA
(ආ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(ඇ) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

2. ජාතික හැඳුනුම්පත් අංකය :————. (පිටපතක් අමුණන්න)

3. තැපැල් ලිපිනය :-

| | සිංහලෙන්/දෙමළෙන් | ඉංග්‍රීසියෙන් |
|---|---|---|
| | ........................ | ........................ |
| | ........................ | ........................ |
| | ........................ | ........................ |
| | ........................ | ........................ |

4. (අ) ස්ථිර ලිපිනය :-

| | සිංහලෙන්/දෙමළෙන් | ඉංග්‍රීසියෙන් |
|---|---|---|
| | ........................ | ........................ |
| | ........................ | ........................ |
| | ........................ | ........................ |
| | ........................ | ........................ |

(ආ) දුරකථන අංකය : ජංගම | | | | | | | | | | |

ස්ථිර | | | | | | | | | | |

(ඇ) පදිංචි දිස්ත්‍රික්කය :- සිංහලෙන්/දෙමළෙන් :————. ඉංග්‍රීසියෙන් :————.

(ඈ) ඔබ මෙම දිස්ත්‍රික්කය තුළ ස්ථිර පදිංචිකරුවෙක් ද? ඔව්/නැත :————.

(ඉ) ඔව් නම් කොපමණ කලක පටන් ද? :————.

5. උපන් දිනය :- වර්ෂය :————. මාසය :————. දිනය :————.

2024.06.07 දිනට වයස : අවුරුදු :————. මාස :————. දින :————.

6. ස්ත්‍රී/පුරුෂ භාවය :- ස්ත්‍රී ☐ පුරුෂ ☐ (අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න.)

7. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද යන වග : ඔව් ☐ නැත ☐ (අදාළ කොටුවේ ✓ලකුණ යොදන්න.)

8. විවාහක/අවිවාහක බව :- විවාහක ☐ අවිවාහක ☐ (අදාළ කොටුවේ ✓ලකුණ යොදන්න.)

9. අධ්‍යාපන සුදුසුකම් :-

| අනු. අංකය | සමත් වූ උපාධිය | සාමාර්ථය | ශ්‍රේණියේ සාමාන්‍ය අගය (GPA) හා උපාධිය බල පවත්වන දිනය | විශ්වවිද්‍යාලය | අධ්‍යයන වර්ෂය |
|---|---|---|---|---|---|
| | | | | | |

10. ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු වී තිබේද ? ඔව් ☐ නැත ☐
(අදාළ කොටුවේ√ ලකුණ යොදන්න.)

"ඔව්" නම් විස්තර සපයන්න :————.

11. අයදුම්කරුගේ සහතිකය :-

(අ) මා විසින් *ගැසට්* නිවේදනය හොඳින් කියවා බලා අවබෝධ කරගෙන එහි සඳහන් සියලු කොන්දේසිවලට යටත් ව මෙම අයදුම්පත සම්පූර්ණ කල බවත්, මෙම අයදුම්පතෙ හි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බවත් ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි.

(ආ) මා විසින් කරන ලද මෙම ප්‍රකාශය හෝ අයදුම්පතෙ හි සඳහන් කර ඇති කුමන හෝ තොරතුරක් අසත්‍ය යැයි ඔප්පු වුවහොත් මා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් බව ද මම දැන සිටිමි.

| |
|---|
| ලංකා බැංකු තැප්‍රොබේන් ශාඛාවේ, අංක 7041318 දරන සෞඛ්‍ය ලේකම් විභාග ගාස්තු රැස්කිරීම යන ගිණුමට අදාළ මුදල් ගෙවා එම ලදුපතෙ හි මුල් පිටපත මෙම ස්ථානයේ නොගැලවෙන සේ අලවන්න. |

දිනය :————.

————,
අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන.

12. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම* :-

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ........................ මයා/මිය/මෙනෙවිය මා පෞද්ගලික දන්නා හඳුනන බව ද, ඔහු/ඇය ........................ දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද සහතික කරමි.

දිනය :————.

————,
සහතික කරන්නාගේ අත්සන
සහතික කරන්නාගේ නිල මුද්‍රාව

සහතික කරන නිලධරයාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.

13. ඉල්ලුම් කරන අපේක්ෂකයා රාජ්‍ය සේවාවේ/පළාත් රාජ්‍ය සේවයේ සේවයේ නියුතු අයෙක් නම්, දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය (අදාළ නොවන වචන කපා හරින්න.)

i. ඉහත අයදුම්කරු/අයදුම්කාරිය වන .................................... මහතා/මහත්මිය/මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ ..................... තනතුර දරන බව මින් සහතික කරමි.
ii. ඉල්ලුම් පත්‍රයේ සඳහන් තොරතුරු සත්‍ය තොරතුරු බව සහතික කරන අතර, මොහු/මැය තනතුර සඳහා තෝරා ගත හොත් ඔහු/ඇය දරන තනතුරට නිදහස් කල හැකි/නොහැකි බව දන්වමි.
iii. එමෙන්ම මෙම බඳවා ගැනීම බාහිර බඳවා ගැනීමක් බවත්, ඔහු/ඇය අදාළ පුහුණුව සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් හෝ නොකිරීමෙන් පසු කිසිඳු අයුරකින් දැනට දරන තනතුරට නැවත පැමිණිය නොහැකි බවත්, ඔහුට/ඇයට අවබෝධ කර දුන් බවත් දන්වා සිටිමි.

දිනය :————.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නම :————.
තනතුර :————.
ලිපිනය :————.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිල මුද්‍රාව.

05-254

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.